ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2008

**ESC 2315 - පූර්ව ළමාවියේ සංවර්ධනය**

කාලය - පැය තුනයි.

---

දිනය - 2008 අගෝස්තු 17 වන දින　　　　වේලාව - පෙ.ව.09.30- ප.ව.12.30

---

**පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ ප්‍රශ්ණ තුනකට (03)පමණක් ද පිළිතුරු සපයන්න.**

**පළමු කොටස**

01. I.. පෙර පාසැල් ළමුන්ගේ, සාමාජීය සංවර්ධනය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

II. සමාජානුයෝජනයට සම්බන්ධ ක්‍රියාවලින් තුන (03) නම් කරන්න.

02. I. පෙර පාසැල් ළමුන්ගේ චිත්තවේගී සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පෙර පාසල් ගුරුවරිය සතුවිය යුතු ලක්ෂණ තුනක් නම් කරන්න.

II. ඉන් එකක් තෝරාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.

03. I. මුල් ළමාවියේ දරුවන්ගේ මනෝ චාලක හැකියාවන්ගේ ප්‍රභේද දෙක නම් කරන්න.

II. ඉහත දැක්වූ හැකියා සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් දෙක බැගින් දක්වන්න.

04. I. සදාචාරාත්මක සංවර්ධනය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

II. ළමුන් සදාචාරාත්මක හැසිරීම් ඉගෙන ගන්නා ක්‍රම තුනක් (03) දක්වන්න.

05. I. පියාජේ විසින් ඉදිරිපත් කරන ලද ළමයාගේ චින්තනයේ සංවර්ධන අවධි නම් කරන්න.

II. එම අවධිවලින් එකක් තෝරාගෙන එහි ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.

06. I. ප්‍රධාන දෙමාපිය රටා නම් කරන්න.

II. ඉන් ඔබ කැමති එක් රටාවක් තෝරාගෙන එය ළමයින්ගේ සංවර්ධනය කෙරෙහි බලපාන අන්දම කෙටියෙන් පැහැදිලි කරන්න.

07. I. කථනය සංවර්ධනය කෙරෙන අත්‍යාවශ්‍ය සාධක හතරක් (04) නම් කරන්න.

II. ළමුන් අතර කථන හැකියාවන්ගේ විචලනයක් ඇතිවීමට හේතු කෙටියෙන් පැහැදිලි කරන්න.

08. I. නවජ දරුවාගේ මූලික ශාරීරික අවශ්‍යතා තුනක් (03) නම් කරන්න.

III. ඉන් එකක් තෝරා එම අවශ්‍යතාව ප්‍රමාණවත් ලෙස ඉටු නොවීමෙන් සංවර්ධනයේ ඇතිවිය හැකි ගැටළු කෙටියෙන් පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 5 x 8 = 40)

## දෙවන කොටස

09. "සෑම ජීවියෙකුම ඔහුට ආවේණිකවූ වංශ ප්‍රවේණියේ (ontogeny) මෙන්ම ඔහුගේ පරිසරයේ ද නිෂ්පාදනයක් (ඵලයක්) වේ."

මානව සංවර්ධනයට බලපාන සාධක විග්‍රහ කෙරෙන මත තුනක් ඇසුරින් ඉහත ප්‍රකාශය විමසන්න.

(ලකුණු 20)

10. "ළමයාගේ පූර්ණ සංවර්ධනය යනු ළමා සංවර්ධනයේ සියළු අංශ සමෝධානිත වීමය."

I. ළමා සංවර්ධනයේ එක් එක් අංශය නම් කරන්න. (ලකුණු 07)

II. ඉහත අංශ අතර අන්තර් සම්බන්ධතාව පූර්ණ සංවර්ධනය සඳහා වැදගත් වන අයුරු උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 13)

11. I. ළමයින් ඉගෙනුම සඳහා උපයෝගී කර ගන්නා උපාය මාර්ග නම් කරන්න.

(ලකුණු 04)

III. ඉහත සඳහන් කළ උපාය මාර්ග අතරින් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

III. ඉහත විස්තර කරන ලද උපාය මාර්ග අතුරින් එකක් (01) තෝරා ගන්න. එය ඇසුරින් ඉගෙනුම් අත්දැකීම් ලබා දීම සඳහා ක්‍රියාකාරකමක් සංවිධානය කරන අයුරු පැහැදිලි කරන්න. එයට පහත කරුණු අඩංගු කරන්න.

අ. ක්‍රියාකාරකම පිළිබඳ කෙටි හැඳින්වීමක්
ආ. ක්‍රියාකාරකමෙහි අරමුණු
ඇ. අවශ්‍ය ඉගෙනුම් - ඉගැන්වීම් ආධාරක
ඈ. ගුරු භූමිකාව සහ සිසු භූමිකාව

(ලකුණු 08)

12. I. පූර්ව ප්‍රසව සංවර්ධනයේ විවිධ අවස්ථා නම් කරන්න. (ලකුණු 03)

II. ඉහත අවස්ථාවල සිදුවන සංවර්ධනය කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 07)

III. පූර්ව ප්‍රසව අවධියේ දරුවාගේ සංවර්ධනය උදෙසා ගර්භණී මවකට දිය හැකි උපදෙස් මොනවාදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 10)

13. I. අලුත උපන් බිළිඳාට උත්තේජන ලබාදීමේ ක්‍රම නම් කරන්න. (ලකුණු 04)

II. බිළිඳාට උත්තේජන ලබාදීමේදී මවට මෙන්ම පියාටද එක හා සමාන වගකීමක් ඇත යන කියමන විභාග කරන්න. (ලකුණු 08)

III. උත්තේජන ලබාදීම සඳහා ක්‍රීඩාවල ඇති වැදගත්කම පහදන්න. (ලකුණු 08)

14. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. පෝෂණය අඩු ළමයින් හඳුනා ගැනීම.
II. මුල් ළමා වියේ දැකිය හැකි ගැටළු සහිත චර්යා
III. යහපත් මාතෘකරණයෙහි ප්‍රතිඵල

(ලකුණු 10 x 2 = 20)
(මුළු ලකුණු 20 x 3 = 60)

- හිමිකම් ඇවිරිණි. -